ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri

**ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර**

**Sri Sumangala College – Panadura**

# ඉතිහාසය II
# History II

නම / අංකය : ..........................................................................

**10 ශ්‍රේණිය**

## II කොටස

- ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න (පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.)

**කාලය පැය 02 යි**

01\. දී ඇති ලංකා සිතියමෙහි පහත දැක්වෙන ස්ථාන ලකුණු කරන්න.

මහවැලි ගඟ, ඉබ්බන්කටුව, මිහිහාගල් කන්ද, කැළණි ගඟ, කලා ඔය,දඹකොළ පටුන, මහනුවර, මන්නාරම් දූපත, ත්‍රිකුණාමලය, මැණික් ගඟ

(ලකුණු -10 යි)

(ආ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

1.මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2.ඔහු ජීවත් වූ රට කුමක්ද?

3.මොහු කිනම් ජාතිකයෙක්ද?

4.ඔහු සම්බන්ධ වන විෂය ක්ෂේත්‍රය කුමක්ද?

(ලකුණු - 04යි)



B

1.මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2.මෙම මූර්තිය පිහිටා ඇත්තේ කොහිද?

3.මෙම කැටයමින් නිරූණය වන්නේ කුමක්ද?

4.මෙමගින් හෙළිවන කලා සම්ප්‍රධාය කුමක්ද?

(ලකුණු - 04යි)

02\. (1) තමන් විසින් නොදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තබා ඇති පහත සඳහන් කතුවරුන් නියෝජනය කල රට පිළිවෙළින් නම් කරන්න.

A - හියුං සැයෑං

B - මෙගස්තිනිස්

C - ප්ලිනි

(ලකුණු - 03යි)

(2) ඓතිහාසික වැදගත්කමකින් යුත් සීගිරි චිත්‍ර මගින් අභිත කාන්තාවන්ගේ තොරතුරු ලබාගත හැකි අංශ 02 ක් සඳහන් කරන්න.

(ලකුණු -04 යි)

(3) (a) මුල් ඓතිහාසික යුගය ලෙස සැලකෙනුයේ කවර කාලවකවානුවක්ද?

(b) සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන්ව තිබූ වාපිගාම 03ක් නම් කරන්න.

(ලකුණු - 05 යි)

(4) පූර්ව ඓතිහාසික යුගයේ පරිවර්තනීය ලක්ෂණ 03 ක් සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

03. (1) දකුණු පළාතට අයත් අර්ධ ශුෂ්ක කලාපයේ කැණීම් කරන ලද ස්ථාන තුනක් නම් කරන්න.

(ලකුණු - 03 යි)

(2) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත්ව සිටි ප්‍රධාන රිසර කලාප හතරක් නම් කරන්න.

(ලකුණු - 04 යි)

(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ ජීවන රටාවේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

(ලකුණු - 05 යි)

(4) මෙරට ගල් යුගයේ ආහාර රටාව සකස් වී තිබූ ආකාරය කරුණු 02 කින් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

04. (1) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මහාශිලා සුසාන හමු වී ඇති ස්ථාන 03 ක් නම් කරන්න. (ලකුණු - 03 යි)

(2) පහතින් සඳහන් කර ඇති විසූ ගම්, වරහන් තුලින් තෝරා නම් කරන්න.

A - වඩුවන් විසූගම්
B - ධීවරයින් විසූගම්
C - ගොපල්ලන් විසූගම්
D - ගොවියන් විසූ ගම්

(කේවට්ටගාම, කසීකාරගාම,පට්ටනගාම, කුම්භකාරගම, ගෝපාලගාම, මතාරගාම, වඩ්ඩකීගාම)

(ලකුණු - 04 යි)

(3) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය උදාහරණ සහිතව කරුණු 02 කින් පැහැදිලි කරන්න.

(ලකුණු - 05 යි)

(4) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් උඛරංචාමඩමේ නේවසික ස්ථානයේ සිදුකල කැණීම්වලින් හෙළිකරගත් තොරතුරු කරුණු 03 ක් මගින් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

05. (1) පහත සඳහන් විශේෂ නාමයන් භාවිතා කළ රජවරුන් පිළිවෙලින් නම් කරන්න.

A - මින්නේරි දෙවියන්

B - නරේශ්වර

C - කාලිංග චක්‍රාවර්ති ස්වාමීන් වහන්සේ

(ලකුණු - 03 යි)

(2) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු බිහිවූ රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ පහත දැක්වෙන තනතුරු අතීතයේ හැඳින් වූ ආකාරය වරහන් තුලින් තෝරා ලියන්න.

(ශෙනපති, මහමත,කනඩේක, බඩගරක, බතගු,හති අදෙන, නතර ගුහිත, පන අදෙන)

A - නගර පරිපාලක

B - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී

C - සේනාපති

D - භෝජනාගාර අධිපති

(ලකුණු - 04 යි)

(3) ගමක ප්‍රධානියා වූ ගමිකගේ කාර්යයන් 03 ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.
(ලකුණු - 05 යි)

(4) වසභ රජතුමාගෙන් සිදු වූ ආගමික හා ආර්ථික සේවාවන් විස්තර කරන්න.
(ලකුණු - 06 යි)



